**අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 65 වගන්තිය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවකාලය සමාලෝචනය නොකිරීම නිසා සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු.25,341,128 ක් වූ වත්කම්වල ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | මෙම වත්කම් දැනට භාවිත මට්ටමේ පවතින අතර විමසුමට අනුව අප එය ප්‍රත්‍යාගණනය කළ යුතුයි. එමෙන්ම මෙහි සඳහන් රු 25,341,128 ඇතුලත ආයතනට අයත් සියළුම වත්කම් කාණ්ඩයන්ට අයත් වත්කම් ඇතුලත් වේ. යම් හෙයකින් ප්‍රත්‍යාගණනයකට යොමුවන්නේ නම් එකී සියළුම කාණ්ඩයන්ට අදාලව ආයතනයේ සියළුම වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු බැවින් එය ඉතා අධික වියදමක් යන කාර්යයක් බව විගණන කමිටුවලදී අප කිහිප විටක්ම පැහැදිලි කළෙමු. රටේ පවතින මෙවන් වාතාවරණයක් තුල අධික වියදමක් දැරීම කාලෝචිත නොවන බව අභ්‍යන්තර විගණන කමිටුව මගින් නිර්දේශ කරන ලදී. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම්වල ක්ෂය නිවැරදිව ගිණුම්ගත නොකිරීම හේතුවෙන් | 2022 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී ජනල් සටහනක් | වත්කම්වලට අදාළ ක්ෂය |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත හා උපකරණවල ලියාහල අගය රු.2,525,760ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | මගින් මෙම ගැලපීම නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | වියදම නිවැරදිව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ආ) ගිණුම් සකස් කිරීම උපචිත පදනම මත සිදුකරනු ලබන බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර තිබුණද මණ්ඩලයේ ආදායම් ගිණුම්ගත කිරීම මූල්‍ය පදනමට සිදුකර තිබුණි. මෙම නිසා 2022 වර්ෂය වෙනුවෙන් මණ්ඩලයට ලැබී තිබුණු රු.10,492,864ක් හා 2020 වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.3,585,390ක් පිළිවෙලින් ඉදිරි වර්ෂයට අදාළ ආදායමක් ලෙස හා පෙර වර්ෂ ගැලපීමක් ලෙස ගිණුම්වල ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම සහ අතිරික්තය රු.14,126,700 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ප්‍රතීතන ප්‍රදානයක් සිදුවූ පසු එය වර්ෂ 3 කට වලංගු වන අතර සෑම වර්ෂයකම වාර්ෂික ගාස්තුවක් අය කරනු ලැබේය .ම් හෙයකින් ප්‍රතීතනය ලබාගන්ත ආයතනය එය ඉවත් කර නොගතහොත් අඛණ්ඩවම වාර්ෂික ගාස්තු අයකිරීම සිදුවන බැවින් කාලච්ඡේදය නොසලකා හැර වර්ෂයටම අදාලව ගිණුම්ගත කිරීම සිදුකරනු ලැබේ. එහෙත් 2022 වර්ෂයේ සිට මේ අනුව ගැලපීමට කටයුතු සිදුකරමි. | ගිණුම්කරණ කාලය පදනම් කරගෙන ආදායම් හා වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය. |
| (ඇ) විදේශ ආධාර ලෙස 2020 වර්ෂයේදී ලැබුණු යුරෝ 92,465ක් වටිනා තාක්ෂණික සහ රසායනාගාර උපකරණ 03 ක් ද, 2021 වර්ෂයේදී ලැබුණු යුරෝ 155,191 ක් වටිනා රසායනාගාර උපකරණ 02 ක් ද ලෙස මුළු වටිනාකම යුරෝ 247,656 ක් වූ උපකරණ වත්කම් ලෙස සහ විදේශාධාර ලැබීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ලංකාව තුල නව හා පවතින ප්‍රතීතන යෝජනා ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා පහසුකම් හා සේවා සපයන්නකු ලෙස මණ්ඩලය කටයුතු කිරීමේදී PTB ආයතනය මගින් ලබා දී ඇති උපකරණ ප්‍රතිලාභ ලාභියා නිශ්චිතව හඳුනාගන්නා තුරු ඒ සඳහා දැරූ නිශ්කාෂණ වියදම් පමණක් වත්කම් ලේඛනයේ සටහන් කර තබන අතර හිමිකාරිත්වය හුවමාරු වන අවස්ථාවේදී එය ගිණුම්වලින් බැහැර කරනු ලැබේ . 2022 වර්ෂයේදී මෙම වත්කම් වලින් කිහිපයක් හඳුනාගත් ආයතන කිහිපයකට පැවරීමට කටයුතු යොදා ඇත. | කවර ආකාරයකින් හෝ ආයතනය වෙත ලැබී ඇති වත්කම් නිසි ලෙස ගිණුම් ගත කර භාවිතයට ගැනීමට හෝ ආයතනය තුළ නිශ්කාර්යව තබා නොගෙන වෙනත් ආයතනයකට වහාම පැවරීම් කිරීමට හෝ කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
------------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 14,524,699 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 10,283,005 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,241,694 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 7,069,638 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් මාර්ගෝපදේශයේ 6.6 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී මාස පහකට පසුව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2020 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2022 අගෝස්තු 01 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | අදාල වාර්තාව මුද්‍රණ කටයුතු අවසන් කර ඇති අතර අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට සුදානම්කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

### 3.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් ක්‍රියාකාරකම් අතුරින් ක්‍රියාකාරකම් 28 ක් වර්ෂය තුළ සිදුකර නොතිබුණු බැව් 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | මෙතෙක් පිළිතුරු ලබා දී නැත. | වර්ෂය තුළ ඉටුකිරීමට සැලසුම් කරන ලද කාර්යයන් නිම කිරීමට කටයුතු කළ යුතුය. |